**කිවිදා හමුව**
**2, ග්‍රීන්ලන්ඩ්ස් මාවත, කොළඹ 5, ශ්‍රී ලංකාව**
**ඊ මේල්:** chandraj111@gmail.com
දුරකථනය: 0773634444 ෆැක්ස්: 2504181

කිවිදා හමුව, ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍යය සඳහා කැපවී සිටින ස්වයං මූලායන අනියම් පුරවැසි කණ්ඩායමකි. එය අවුරුදු පහක් තිස්සේ, පුරවැසි අයිතිවාසිකම් පිළිබඳව මහජනයා දැනුවත් කිරීමට කටයුතු කර ඇත. අප කටයුතු කරන්නේ පක්ෂග්‍රාහීත්වයකින් තොරව රජය මෙන්ම විපක්ෂය ද විවේචනයට ලක්කිරීමේ පිළිවෙතක් අනුවය

2015 ජනවාරි 2

## ප්‍රවෘත්ති නිවේදනය

## ඡන්ද දායකයන්ට අවසාන ආයාචනයක්

තව සතියකට අඩු කාලයක් තුලදී, ඉදිරි වර්ෂ හයක් කාලය තුල තනතුර දැරීමට ජනාධිපතිවරයෙකු තෝරාපත් කරගැනීම සඳහා ශ්‍රී ලාංකික ඡන්ද දායකයන් ඡන්දය විමසීමකට මුහුණ දෙනු ඇත. මෙය, නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ පැවැත්වෙන, පෙර කවරදාකටත් වඩා තීරණාත්මක සහ රටේ ඉරණම නිශ්චය කරන ඡන්ද විමසීම විය හැක. ඡන්දය ප්‍රකාශ කිරීම අයිතියක් මෙන්ම යුතුකමක් වන අතර එය ඉටු කරන ලෙස සෑම ශ්‍රී ලාංකිකයෙකුටම අවධාරණය කරමු. දේශපාලන බැඳීම් කවරක් වුවද ඡන්දය ප්‍රකාශ කිරීමේදී ඉදිරිපත් වී ඇති ප්‍රශ්ණ සැලකිල්ලට ගත යුතු බව කිවිදා හමුව සියලු ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉල්ලා සිටී. අපගේ ඡන්දය, ඉදිරි වර්ෂ රාශියකට මේ රටේ මෙන්ම අනාගත ළමා පරම්පරාවල අනාගත දේශපාලන, සමාජයීය සහ ආර්ථික අනාගතය තීරණය කරන්නක් වනු ඇත.

ප්‍රචණ්ඩත්වයෙන් තොර නිදහස් සහ සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ වගකීම උසුලන විවිධ තරාතිරම්වල නිලධාරීන්ට, දෙසැම්බර් දොළොස්වැනිදා නිකුත් කළ අපගේ ප්‍රකාශනය මගින් ආයාචනයක් කළෙමු. එක්සත් ජාතික පක්ෂ මූලස්ථානය ඉදිරිපිට ඇතිවූ ගැටුම, මැතිවරණ නීති වලට පටහැනි ප්‍රචාරක දැන්වීම් සහ කටවුට් නොනවත්වා ප්‍රදර්ශනය කිරීම සහ ගිනිතැබීමේ චෝදනාවක් සම්බන්ධයෙන් සැකකරුවෙකුවී අත්අඩංගුවට ගැනීමට නිකුත් කරන ලද වරෙන්තුවක් තිබියදී නිශාන්ත මුතුහෙට්ටිගම නියෝජ්‍ය ඇමතිවරයා බණ්ඩාරනායක ගුවන්තොටුපලේ ප්‍රභූ පර්යන්තයෙන් සිංගප්පූරුවට සැඟවී ගිය බවට වූ වාර්තාව වැනි සාහසික ප්‍රචණ්ඩ ක්‍රියා දකින්නට ලැබීම ඛේදයට කරුණකි. මේ එකක්වත් කෙරෙහි නීතියේ බලපෑමක් සිදුවී නැත.

ස්වාධීන අධිකරනයකින් සහ රාජ්‍ය සේවයකින් ශක්තිමත්වූ සහ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍ර ක්‍රමයක හර පද්ධතීන් මත පදනම්වූ, නීතියේ අධිපත්‍යය සහ යහ පාලනය සහිත රටක අපටත් අපේ දරුවන්ට සහ ඉදිරි පරම්පරාවන්ට ජීවත් වීමේ අවස්ථාව ලැබිය හැකිදැයි තීරණය කිරීමට මෙම ඡන්ද විමසීමේදී අවස්ථාව ලැබේ. අප ඉදිරියේ ඇති විකල්පවලින් කවර මොඩලයක් මගින්, විශේෂයෙන්ම, අසරණ ජන කොටස් ඇතුළු මුළු මහත් ජනතාවගේ අවශ්‍යතා සපුරාලන තිරසාර සහ ජන කේන්ද්‍රීය සංවර්ධනයක් සහ සම්පත් සාධාරණ ලෙස බෙදී යන ක්‍රමයක් ගොඩනැගිය හැකිදැයි අප විසින් සැලකිල්ලට භාජනය කළ යුතුය. ඡන්දය පාවිච්චි කිරීමේදී, අපට අවශ්‍ය වී ඇති, අපගේ සංස්කෘතික, ආගමික සහ වාර්ගික විවිධත්වයෙන් යුත් අප උරුමයන්ට ගරු කරමින් සියලු ජන කොට්ඨාසවලට සාමයෙන් සහ මිත්‍රත්වයෙන් ජීවත් විය හැකි, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මානුෂීය අයිතීන් ක්‍රියාවට නැගීමට ඉඩ කඩ ඇති රටක් නිර්මාණය කළ හැකි අපේක්ෂකයා කවුරුන්දැයි අප විසින් තෝරා ගත යුතුය.

ජනාධිපතිවරණය, අපට ඡන්දය දිය හැකි විකල්ප අපේක්ෂකයන් කිහිප දෙනෙකු ලබා දී ඇත. ව්‍යවස්ථාපිත අයිතියක් සහ ප්‍රජා යුතුකමක් වන ඡන්දය පාවිච්චි කළ යුත්තක් බව සියලු ඡන්ද දායකයන් වෙත කිවිදා හමුව අවධාරණය කර සිටී. අපටත්, ඉදිරි පරම්පරාවලටත් ශ්‍රී ලංකාව තුල

ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය, සාමය සහ මිත්‍රත්වය සපුරා ගැනීමට හොඳම අවස්ථාව අපට ලබා දිය හැක්කේ කවර අපේක්ෂකයාටදැයි සලකා බලන ලෙස අප සහෝදර ඡන්ද දායකයන් වෙත අවධාරණය කරමු. මෙය සපුරාලීම පහසුවෙන් සිදු නොවිය හැකිය; එහෙත් එම ක්‍රියාවලියට මුලපිරිය යුතු අතර, එය ඵල දරණ බවට අපට වග බලා ගත හැකිය.



**ජයන්ත ධනපාල,** මහාචාර්ය සාවිත්‍රී ගුණසේකර, මහාචාර්ය කාමෙනා ගුණරත්න,

---

**කිව්දා හමුව වෙනුවෙනි**

ජයන්ත ධනපාල මයා, මහාචාර්ය සාවිත්‍රී ගුණසේකර, මහාචාර්ය කාමෙනා ගුණරත්න, ෆෛස් උර් රහමන් මයා, පුලස්ති හෙවාමාන්න මයා, මහාචාර්ය ගණනාථ ඔබේසේකර, ජාවිඩ් යූසුෆ් මයා, මනෝරි මුත්තෙට්ටුවෙගම මිය, මහාචාර්ය රංජිනී ඔබේසේකෙර, ප්‍රියන්ත ගමගේ මයා, මහාචාර්ය අර්ජුන අළුවිහාරේ, තිස්ස ජයතිලක මයා, රධිකා කුමාරස්වාමි මෙය, ඩමරිස් වික්‍රමසේකර මිය, ශාන්ති ඩයස් මිය, ආචාර්ය දීපිකා උඩගම, සූශී වික්‍රමසිංහ මිය, ආචාර්ය සෙල්වී තිරුචන්ද්‍රන්, ගරු ආචාර්ය ජයසිරි පීරිස්, අතිගරු දුලීප් ද චිකේරා, මහාචාර්ය ගමීල සමරසිංහ, ආචාර්ය ඒ.සී.විශ්වලිංගම්, ආචාර්ය උපතිස්ස පෙතියාගොඩ, ආචාර්ය ජී. උස්වත්තෙ - ආරච්චි, එස්.සී.සී.ඉලංගෝවන් මයා, දනේෂන් කාසිචෙට්ටි මයා, චන්ද්‍රා ජයරත්න මයා, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, සුරේෂ් ද මෙල් මයා

කිව්දා හමුව, ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍යය සඳහා කැපවී සිටින ස්වයං මූලායන අනියම් පුරවැසි කණ්ඩායමකි. එය අවුරුදු පහක් තිස්සේ, පුරවැසි අයිතිවාසිකම් පිළිබඳව මහජනයා දැනුවත් කිරීමට කටයුතු කර ඇත. අප කටයුතු කරන්නේ පක්ෂග්‍රාහිත්වයකින් තොරව රජය මෙන්ම විපක්ෂය ද විවේචනයට ලක්කිරීමේ පිළිවෙතක් අනුවය.